සුපිළිපන් දේශයක් ගොඩනැගීමට අප්‍රතිහත ධෛර්යයකින් හා නිර්භයව කටයුතු කරන පුද්ගලයින් හා සංවිධාන ඇගයීම වෙනුවෙන්

සෑම වසරකම දෙසැම්බර් 09 වනදාට යෙදෙන අන්තර්ජාතික දූෂණ විරෝධී දිනය සැමරීම සඳහා

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා

# ජාතික සුපිළිපන් ප්‍රණාම

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

සුපිළිපන් දේශයක් උදෙසා

# ජාතික සුපිළිපන් ප්‍රණාම

## සුපිළිපන්බව හා යහපාලනය වෙනුවෙන් පුරෝගාමී මෙහෙවරක යෙදුණු පුද්ගලයන් හා සංවිධාන/ආයතන ඇගයීම

## ඇතුළත ............


පිටුව

1. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ අගයයන් ......................... 4
2. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ප්‍රතිපත්ති ............. 4
3. 'දූෂණය' යනු කුමක්ද? ........................................................................ 5
4. 'සුපිළිපන් බවින් යුත් දේශයක් ගොඩනැගීම' ......................................... 7

- දූෂණ විරෝධී ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය ලබන්නේ කුමකටද? 8
- සුපිළිපන්භාවය ශක්තිමත් කරලීමට වර්තමානයේ පවතින අභියෝග 8
- එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය 8

5. ජාතික සුපිළිපන් ප්‍රණාම

- යෝග්‍යතාවය/සුදුසුකම් 9
- පුරෝගාමී දූෂණ විරෝධී ක්‍රියාකාරකම් 12
- පිළිගැනීමට ලක් නොවීමට ඉඩකඩ වැදගත් ක්‍රියාකාරකම් 13
- සම්මාන ලැබීම සඳහා සුදුසුකම් නොලබන්නේ කවුරුන්ද 13
- නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ කෙසේද 14
- නාමයෝජනා ලිපිගොනුව 14
- සම්මානලාභීන් ප්‍රකාශයට පත් කිරීම 15
- සම්මාන 15
- නාම යෝජනා කැඳවීම 15

6. ජාතික සුපළිපන් සම්මාන විනිසුරු මඬුල්ල 16

- සම්මාන ආපසු කැඳවීම 16
- විනිසුරු මඬුල්ලට නාමයෝජනා ඉදිරිපත් කිරීම 18

ඇමුණුම්

A. නාමයෝජනා අයදුම්පත 18
B. කැමැත්ත පළකිරීමේ ලිපිය 20
C. සුපිළිපන් ප්‍රතිඥාව 21
D. ඥාතීන් නොවන දෙදෙනෙකු සහතික කිරීම 22
E. විනිසුරු මඬුල්ල විසින් සලකා බැලෙන නිර්ණායකයන් 23

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ අගයන්

විනිවිදභාවය
වගවීම
සුපිළිපන්භාවය
ප්‍රජාතන්ත්‍රවාදය
සහයෝගීතාව
සාධාරණ සහ යුක්තිසහගත බව
පක්ෂග්‍රාහී නොවීම
නිර්භීත බව
ඉවසා දරා සිටීම

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම්

බලගැන්වීම
දැනුම්වත් බවින් යුත් ක්‍රියාකාරීත්වය
අන්තර්ගත හා සහභාගීත්වය
පූර්ව සුපරීක්ෂාකාරී බව
සාධාරණත්වය
වෙනස්කම් සඳහා ඉඩ නොතැබීම
යහපත් ප්‍රතිපත්තීන් පිළිගැනීමට ලක් කිරීම හා දිරිගැන්වීම
ඉහළම ප්‍රමිතීන් අනුගමනය කිරීම

## දූෂණය යනු කුමක්ද?

දූෂණය පිළිබඳව වඩාත් පිළිගැනීමට ලක්ව ඇති අර්ථකථනය නම් පැවරී ඇති බලතල පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා අයථා ලෙස පරිහරණය කිරීමයි.[1]

දූෂණය පිළිබඳ පවත්නා තවත් අර්ථකථනයක් වනුයේ පොදු, පුද්ගලික රාජකාරීමය කාර්යයන් හෝ වගවීමක් හෝ දරණ පුද්ගලයෙකු එම වගකීම ඉටුකිරීමේදී තමාට හිමි බලතල අයුතු ලෙස යොදා ගැනීමය.

යම් පුද්ගලයෙකු නීති ප්‍රකාරව තමන්ට පැවරී ඇති වගකීම් හා බලතල තම සුභසිද්ධිය සඳහා අයථා ලෙස යොදාගනී නම් එහිදී දූෂණයක් සිදුවේ.

එහි ප්‍රබේදයන් පවතී.

- රජයට සහ පොදු මහජනතාවට පාඩු සිදු කරමින් රාජ්‍ය ආයතන පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා යොදාගැනීම
- අධිකාරීමය බලයක් පවතින පුද්ගලයා එම බලය අයුතු ලෙස පරිහරණය කිරීම
- පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා නීති විරෝධි කටයුතු සිදුකිරීම
- යමෙකු වෙනුවෙන් ඉටුකරන ලබන සේවාවන් සඳහා ප්‍රදානයන් බලාපොරොත්තුවීම
- යම් පුද්ගලයෙකුගේ හැසිරීම හරහා නීති රීති හා අන් අයගේ අයිතීන් උල්ලංඝනයවීම

## මහා පරිමාණ හා සුළු පරිමාණ දූෂණ

රටක මහා පරිමාණ දූෂණයන් බොහෝ විට ජාතික මට්ටමින් හා රාජ්‍ය මට්ටමින් සිදුවන අතර එමගින් යහපාලනය මෙන්ම, නීතිය සහ ආර්ථික ස්ථාවරත්වය පිළිබඳව පවත්නා විශ්වාසයන් බිඳ වැටේ.

සුළු පරිමාණ දූෂණය ඉතා කුඩා මුදල් හුවමාරුවක් හරහා සිදුවිය හැකිය.

## සක්‍රීය අල්ලස් සහ අක්‍රිය අල්ලස

සක්‍රීය අල්ලස යනුවෙන් හැඳින්වෙන්නේ අල්ලස් දීමට උත්සාහ ගැනීම හෝ අල්ලස් දීමය. අක්‍රිය අල්ලස වනුයේ අල්ලස ලබාගැනීමය.

[1] Transparency International Plain Language Guide – 2009, Pg.14

## අල්ලස

අල්ලස යනු යම් කාර්යයක් කිරීම පිළිබඳව හෝ යම් තීරණයක් ගැනීම පිළිබඳව අයුතු ලෙස බලපෑම් කිරීම සඳහා යම් වාසියක් ලබාදීම, ලබාදීමට පොරොන්දුවීම හෝ ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කිරීමයි.

අල්ලස වඩාත්ම ප්‍රකටව දක්නට ලැබෙන දූෂණයේ ප්‍රබේදයයි. මුදල් සහ වටිනා ත්‍යාග, සමාගම් කොටස්,ඇතුළත තොරතුරු, සංග්‍රහ, රැකියා සැපයීම සහ පොරොන්දු අල්ලස් අතර ප්‍රකටය.

## දේපළ වංචා කිරීම සහ වංචාව[2]

දේපළ වංචා කිරීම සහ වංචාව යනු වංචනික ක්‍රම භාවිතා කරමින් මුදල් දේපළ හෝ වෙනත් වටිනා දේ තමාට හිමි නොවන දෙයක් හිමි ලෙස අන්‍යයන්ට පෙන්වා එය වැරදි සහගත ලෙස ලබා ගැනීමය.

## බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම

යම් තැනැත්තෙකුට අයුතු සහගත වාසියක් සිදුකිරීමේ අදහසින් තමාට හිමි බලතල අයථා ලෙස භාවිතා කිරීම හා තම නිල බලය නීති විරෝධි ලෙස යොදාගනිමින් බලහත්කාරයෙන් වාසියක් ලබාගැනීමය.

## ඥාති සංග්‍රහය සහ පක්ෂපාතීත්වය

සාමාන්‍යයෙන් ඥාති සංග්‍රහය, අනිසි පක්ෂපාතීත්වය, අනුගාමිකත්වය තමන්ට හිමි බලය සූක්ෂම ලෙස යොදාගැනීම හා සම්බන්ධය. මෙවැනි වැරදි බොහෝවිට සිදුවන්නේ නිලධාරියෙකුගේ පුද්ගලික වාසිය සඳහා නොව පවුල් සබඳතා, දේශපාලන පක්ෂ සබඳතා, කුලය, ආගම, මිත්‍රත්වය වැනි කරුණු හෝ කාගේ හෝ උවමනාවකටය.

තොරතුරු මුලාශ්‍ර ඃ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය දූෂණයට එරෙහි ගෝලීය වැඩසටහන, එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධි මෙවලම් තුන්වන මුද්‍රණය වියානාහීදී 2004 සැප්තැම්බර්

[2] Source: United Nations Office on Drugs and Crime, The Global Program Against Corruption, UN Anti-Corruption Tool Kit, Third Edition, Vienna, September 2004

## සුපිළිපන් දේශයක් ගොඩනැගීම

ශ්‍රී ලංකාව පුරා සිටින සියළු ජන කොට්ඨාශයන් සාමකාමී, ප්‍රජාතාන්ත්‍රික, සාධාරණ හා ස්වාධීන සමාජ පරිසරයක ජීවත්වීමට වැඩි කැමැත්තක් දක්වති. නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාව තුළ එවැනි සමාජ වටපිටාවක් ගොඩනැගෙනු ඇතැයි මහත් වූ බලාපොරොත්තු ගොඩනැංවී තිබුණි. ජාතිය ගොඩනැංවීමේ කටයුතුවල නිරතවූ සෑම පුද්ගලයෙකුම කෘෂි කර්මාන්තය, අධ්‍යාපනය, කර්මාන්ත, සෞඛ්‍ය සහ සමාජ යටිතල පහසුකම් පුළුල් කිරීමට මුල් තැන දෙන අතරතුරේදීම විදෙස් ජනකොට්ඨාශයන් අතර කාගේත් ගෞරවයට පාත්‍ර වූ සාමාජික රටක් බවට පත්කිරීමටද කටයුතු කළහ.

මෙම පසුබිම යටතේ ශ්‍රී ලංකාවට ආඩම්බර වි හැකි ජයග්‍රහණයන් රැසක් පවතී. ප්‍රාථමික අධ්‍යාපනය, සෑම පුරවැසියෙකුටම නිදහස් අධ්‍යාපනය, වැඩිහිටි සාක්ෂරතාවය, උපත් මරණ විවාහ ලියාපදිංචිය, වෛද්‍ය උපදේශනය යටතේ සිදුවන දරු උපත් හා සෞඛ්‍ය රැකවරණය, කාර්යක්ෂම තැපැල් සේවය, රාජ්‍ය සේවා සැපයුම් පද්ධතිය සහ සෑම ගම් දනව්වක්ම නියෝජනය වන නිලධාරී තන්ත්‍රයක් පැවතීම එම ජයග්‍රහණ අතර වේ. කෙසේනමුත් විවිධ කාලයන්හිදී ඇතිවූ සමාජමය අරගල, වාර්ගික හා දේශපාලන අර්බුද, තරුණ අසහනය සහ විරැකියාව මෙන්ම භීෂණය සහ දූෂණය නිසි ලෙස අවධානයට ලක් නොවූ පහළටම කිඳා බැසගත් සිදුවීම් බවට පත්විය.

යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව තුළ සංවර්ධන අවස්ථාවන් සහ නව්‍ය ව්‍යාපාරිකමය ශක්තියක් රට පුරා මතුකර ගැනීම සඳහා අවශ්‍යවන පාලනයේ විධිමත් බව ඉහළ නැංවීමට නව ජවයකින් හා කැපවීමකින් ක්‍රියාකිරීම අවශ්‍ය වේ.

එවන් පරිසරයක් ගොඩනැංවිය හැකි වන්නේ සාධාරණත්වය හා දූෂණයෙන් තොර සමාජ වටපිටාවක් පවතින්නේනම් පමණි.

ශ්‍රී ලංකාවේ අතීතය තුළ යහපත් මෙන්ම අයහපත් පාලනයන් පිළිබඳව අත්දැකීම් පවතී. සුපිළිපන් දේශයක් ගොඩනැගීම සඳහා බොහෝ දෑ උගත හැකි අතර පාලන බලය මෙන්ම බලපෑම් කිරීමේ හැකියාව පවතින තනතුරු නියෝජනය කරන පුද්ගලයන් විශ්වාසය ගොඩනැංවීමට සහ ආචාරධර්මයන්ගෙන් හා වෘත්තීයමයභාවයෙන් යුත් ක්‍රියාවන් ඔස්සේ ආර්ථිකමය, අසමතුලිතභාවය, සෑහීමට පත් නොවීම, බිහිසුනු අර්බුධ වැනි දෑ ඇතිවීමට හේතුවන මුල් බැසගත් සිදුවීම් මර්ධනය කරමින් සෑම වරප්‍රසාදයක්ම සමානව හිමිවන සංවර්ධනයක් ඇති කළ හැක.

## දූෂණයට එරෙහිවීම ප්‍රවර්ධනය කළ යුත්තේ ඇයි?

දූෂණය හේතුවෙන් රටක සම්පත් මෙන්ම පොහොසත් බවද විනාශයට ලක්වේ. එමගින් සාධාරණත්වය සහ ස්වාධීනත්වය අහෝසි වන අතර බලපෑම් කළ හැකි පුද්ගලයන්ට පවත්නා නීති කඩකරමින්, ආචාරධර්ම හා මූලික සම්ප්‍රදායන් සහ සමාජ සාධාරණත්වය බිඳ දමමින් තම බලය හා ධනය යොදාගනිමින් අන්‍යයන් තම වාසියට ක්‍රියාකිරීම සඳහා පොළඹවා ගැනීමට හැකියාව ලැබේ. එමගින් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය යටපත් වේ.[3]

[3] The National Integrity Systems study (2011)

## සුපිළිපන්භාවය ශක්තිමත් කිරීමට වර්තමානයේ පවතින අභියෝගයන්

දූෂිත හැසිරීම් මඟින් ඉතා අසුභවාදී හැඟීම් ගම්‍ය කරනු ලබයි. එය හඳුනාගෙන විනාශ නොකළහොත් එය ඉතා පුළුල්ව පැතිර යා හැක. වඩාත් සාධාරණ හා විනිවිද පදනමකින් සිදුවන සමාජ සහ ආර්ථික ගනුදෙනු පාලනය කළ හැකි සම්මුතියක් බවටද එය පත්විය හැක.

මනා දැනුමක් ඇතිව සහ කාර්යක්ෂමව නීතිරීති දැඩිව ක්‍රියාත්මක නොවන විටෙක දූෂණය වර්ධනය වී ඉතා වැදගත් ආයතන පිළිබඳව පවත්නා මහජන මතය පළුදු වී යා හැක. ඉතා පුළුල් ලෙස පැතිරුණු හා මහා පරිමාණ දූෂණයන් මඟින් සෑම පුරවැසියෙකුගේම සුභසිද්ධිය උදෙසා යොදාගත හැකි රුපියල් මිලියන ගණන් වටිනා මූල්‍ය සම්පත් සහ අවස්ථාවන් අහිමි වී යා හැක.

## එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී දිනය

ඉතා ව්‍යාප්තව පැතිරුණු හා හානිකර වූ දූෂණයෙන් ඇතිවන බලපෑම හඳුනාගත් එක්සත් ජාතීන්ගේ සංවිධානය දූෂණයට එරෙහි සම්මුතියක් ඇතිකරගනු ලැබූ අතර එය වසර 2003 ඔක්තෝබර් 31 වන දා පැවති මහ සමුළුවේදී සම්මත කරගන්නා ලදී. වසර 2004 මාර්තු 15 වැනිදා ඊට අස්සන් තබමින් එම සම්මුතියට එකඟ වූ දෙවන රට බවට ශ්‍රී ලංකාව පත්විය. එම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාව විසින් වසර 2004 මාර්තු 31 වැනිදා අනුමත කරන ලදී.[4]

එක්සත් ජාතීන්ගේ සංවිධානය දූෂණය පිළිබඳව ලෝකවාසී ජනතාවගේ අවබෝධය වැඩිකරලීමේත් දූෂණය අවම කිරීම සහ පිටුදැකීම සඳහා ප්‍රඥප්තිය මඟින් ඉටුවන කාර්යභාරය ප්‍රචලිත කරලීමේත් අරමුණ ඇතිව සෑම වසරකම දෙසැම්බර් 09 වනදා ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය ලෙස නම් කරන ලදී.[5] එම දිනය මුල් කරගනිමින් සංවිධානය කරනු ලබන වැඩසටහන් ඔස්සේ බලාපොරොත්තු වන්නේ දූෂණයට එරෙහිවීම සඳහා කැපවී ක්‍රියා කිරීමට ජනතා අවබෝධය වර්ධනය කරලීමය. දූෂණය පිටුදැකීම සඳහා ගනු ලබන උත්සාහයන් ශක්තිමත් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය තම සාමාජික රටවලට තාක්ෂණික සහාය සහ අවබෝධය නිරතුරුව ලබාදෙනු ලබයි.

[4] http://treaties.un.org/Pages/ViewDetails.aspx?src=IND&mtdsg_no=XVIII-14&chapter=18&lang=en

[5] http://www.un.org/en/events/anticorruptionday/index.shtml

# ජාතික සුපිළිපන් සම්මාන

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය සෑම වසරකදීම සමාජ වටපිටාව තුළ සුපිළිපන් බව සුවිශේෂී අයුරින් ප්‍රදර්ශනය කළ පුද්ගලයන්ට සහ සංවිධාන/ආයතන සඳහා ජාතික සුපිළිපන් සම්මාන පිරිනමනු ලබයි. සුපිළිපන් දේශයක් ගොඩනැගීමට, යහපාලනය ශක්තිමත් කරළීමට සහ දූෂණය අවම කිරීමට නිහඬව අප්‍රතිහත ධෛර්යයකින් අඛණ්ඩ අරගලයක යෙදුණු සහ ඇගයීමට ලක් නොවූ සුවිශේෂී පුද්ගලයන් හා සංවිධාන ආයතනයන්ට ගෞරව දැක්වීමටත් ඔවුන් ඇගයීමටත් එමගින් පියවර ගනු ලබයි.

ඕනෑම ක්ෂේත්‍රයක් හෝ පරාසයක් තුළ දූෂණයට එරෙහි සටනේදී පුරෝගාමී සහ අප්‍රතිහත ධෛර්යයකින් කටයුතු කළ පුද්ගලයන් හෝ සංවිධාන/ආයතන පිළිබඳ නාමයෝජනා ඉදිරිපත් කළ හැක.

වසර 2004 දී සම්මාන පිරිනැමීම ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා පුද්ගලයන් 10 දෙනෙකුට සුපිළිපන් සම්මාන පිරිනමා ඇති අතර තවත් පස් දෙනෙකු විශේෂ ඇගයීමට ලක්කර ඇත. එම සම්මානලාභීන් අතර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, ජනමාධ්‍යවේදීන්, වෘත්තීය සමිති සාමාජිකයන් හා අනෙකුත් ක්‍රියාකාරීන් වෙති.

සෑම වසරකදීම ජාතික තලයේ පිළිගැනීමට ලක්වූ සහ සුපිළිපන්බවින් පිරිපුන් ගෞරවාන්විත පුද්ගලයන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඬුල්ලක් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් පත්කරනු ලබයි. නාමයෝජනා ලිපිගොනු සහ ඊට සමගාමීව සිදුකෙරෙන විමර්ශනයන්ගේ වාර්තා සැළකිල්ලට ගනිමින් සුපිළිපන් සම්මානලාභීන් තෝරාගැනීම විනිසුරු මඬුල්ල විසින් සිදුකරනු ලබයි.

කෙසේ නමුත් ජාතික සුපිළිපන් ප්‍රණාම එක් දිනකට පමණක් සීමාවන සම්මාන උළෙලක් නොවේය. එහි ක්‍රියාකාරී වැඩපිළිවෙල පුරා වසරක කාලයකු ක්‍රියාත්මක වන අතර මාස 06 ක කාලයක් සම්මානලාභීන් තෝරාගැනීමට වෙන්වේ. ඉතිරි මාස 06 තුළදී සම්මානලාභීණ් යොදාගනිමින් විවිධ මහජන සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. සම්මානලාභීන් තමන්ගේ අත්දැකීම් මහජන මණ්ඩපවලදී සාමාන්‍ය ජනතාව සමඟ හුවමාරු කරගනිමින් මෙම වැඩපිළිවෙල හරහා දූෂණයට එරෙහි විවිධ ප්‍රතිඵලයන් අත්කර ගැනීමට පියවර ගැනේ.

## ජාතික සුපිළිපන් සම්මාන ක්‍රියාපටිපාටිය

ජාතික සුපිළිපන් සම්මාන විනිසුරු මඩුල්ල හා උපදේශක කමිටුව පත්කර ගැනීම

↓

මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ නාමයෝජනා කැඳවීම

↓

නාමයෝජනා බාරගන්නා අවසාන දිනය

↓

නාමයෝජනා ඇගයීමට ලක්කිරීම හා සම්මානලාභීන් තොරාගැනීම

↓

සම්මාන පිරිනැමීම

↓

සම්මානලාභීන් යොදාගනිමින් වෙනසක් ඇතිකරලීම සඳහා වන ක්‍රියාකාරකම් සිදුකිරීම

↓

මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත් කිරීම

↓

තෝරාගත් ක්ෂේත්‍රයන්හි සිදුකෙරෙන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ වැඩසටහන්


## යෝග්‍යතාවය

ශ්‍රී ලංකාව තුළ දූෂණය අවම කිරීමට සැලකිය යුතු බලපෑමක් ඇති කළ ක්‍රියාවක් සිදුකර ඇති පුද්ගලයන්ට සහ සංවිධානයන්ට ජාතික සුපිළිපන් සම්මාන සඳහා නාමයෝජනා ඉදිරිපත් කළ හැක. එම ක්‍රියාව පුරෝගාමී නව්‍ය හා ධෛර්යවන්ත ක්‍රියාවක් මෙන්ම දේශීය හා ජාත්‍යන්තර ආදර්ශයන් හා ක්‍රියාවන් යොදාගනිමින් සිදුකළ පියවර විය යුතුය. එමෙන්ම එම පියවර ශ්‍රී ලංකාව තුළ දූෂණය මැඩලීමේ ක්‍රියාදාමයට දිගින් දිගටම යොදාගත හැකි පියවරක් විය යුතුය. මෙයට අමතරව දූෂණය අවම කිරීමට පුද්ගලයන් හෝ සංවිධාන වශයෙන් හඳුන්වා දුන්, නිර්මාණය කළ හා ක්‍රියාවට නැංවූ යාන්ත්‍රණයන්ද සම්මාන සඳහා ඇගයීමට ලක් කෙරේ.

දූෂණයට එරෙහිව සටන් වැදීම සඳහා පුද්ගලයන් හෝ සංවිධාන ගනු ලැබූ පියවර ඔවුන් ක්‍රියාත්මක වන වටපිටාව මත වෙනස් විය හැකිය.එබැවින් විවිධ ක්ෂේත්‍රයන්හි සුපිළිපන්බව තහවුරු කිරීමට ගනු ලැබූ පියවර ඇගයීමට ලක්කිරීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය රාජ්‍ය අංශය සහ පුද්ගලික අංශය, ජනමාධ්‍ය, වෘත්තිකයන්, සමාජ ක්‍රියාකාරීන්, අධ්‍යාපනඥයින්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන්, කාන්තා හා තරුණ විවිධ ක්ෂේත්‍රයන්හි දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වූ පුද්ගලයන් හෝ සංවිධාන/ආයතනවල නාම යෝජනා ඉදිරිපත් කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටී.

මියගිය පුද්ගලයන් පිළිබඳව ඉදිරිපත් කෙරෙන නාම යෝජනාද ඇගයීමට ලක්කෙරේ.

යම් ආයතනයක්/සංවිධානයක් හෝ පුද්ගලයෙකු පිළිබඳව යෝජනා 03 ක් දක්වා ඉදිරිපත් කළ හැක. ඊට වැඩි නාම යෝජනා ඇගයීමට ලක් නොකෙරේ.



## ආදර්ශවත් දූෂණ විරෝධී ක්‍රියාකාරීත්වයන්

විවිධ පුද්ගලයන්, කාන්තාවන්,තරුණ තරුණියන්, නිළධාරීන්, මාධ්‍යවේදීන්, වෘත්තිකයන්, දේශපාලනඥයින්, ක්‍රියාකාරීන්, ආගමික නායකයන් සහ සංවිධානයන් තමන් ක්‍රියාත්මක වන විවිධ වටපිටාවන්ගේ සහ ජීවත්වන පරිසරයේදී සාධාරණත්වය සහ ස්වාධීනත්වය සහතික කරලීම සඳහා දූෂණය අවම කිරීමටත් ආයතනික සුපිළිපන් බව ශක්තිමත් කිරීමටත් පියවර ගනිති. එහෙත් බොහෝ අවස්ථාවන්වලදී එම පියවර ප්‍රසිද්ධියට පත්නොවේ.

එබැවින් එවන් උත්සාහයන් පහත දැක්වෙන නිර්ණායකයන් යටතේ ඇගයීමට ලක්කෙරේ.

දූෂණ මැඩලීමට ගත් උත්සාහයේ සැළකිය යුතු බව

එම ක්‍රියාව හෝ උත්සාහය පුද්ගලිකත්වය ඉක්මවා ගිය පහත දැක්වෙන ක්ෂේත්‍රයන් දක්වා බලපෑමක් ඇති කළ පියවරක් වීම.
(අ) අදාළ ආයතනය
(ආ) ප්‍රාදේශීය ජන කොට්ඨාශ තුළ
(ඇ) දේශීය වශයෙන්
(ඈ) අන්තර්ජාතික මට්ටමින්

- අනාගතයේදී පවා දූෂණය මැඩලීමට අවශ්‍ය පූර්වාදර්ශයක් සැපයීම
- තමන් දරණ තනතුර හරහා එල්ල වන දුෂ්කර හා ශක්තිමත් අභියෝගයන් ජයගැනීමට එම ක්‍රියාවන් හරහා සමත් වීම
- සුබවාදී ප්‍රතිඵලයන් අත්කරගැනීමට ආර්ථිකමය, පුද්ගලික , ශාරීරික, සමාජ, වෘත්තීයමය හෝ ආයතනික මට්ටමින් සිදුකළ කැපකිරීම
- දූෂණය මැඩලීමේ සළකුණක් ලෙස එම ක්‍රියාව යොදාගැනීමට හැකිවීම
- දූෂණයට එරෙහි මැදිහත්වීම්වල යෙදීමට තමන් දරණ තනතුර හෝ රැකියාව හරහා ලැබෙන අවස්ථාවන්වල පරාසය
- එම ක්‍රියාව තනි පුද්ගලයෙකු, කණ්ඩායමක් හෝ ආයතනයක් / සංවිධානයක් ලෙස සිදුකිරීම
- දූෂණයට එරෙහිව යොදාගනු ලබන දැනට පවත්නා ක්‍රියාමාර්ගයන් වඩාත් ප්‍රයෝජනවත් ලෙස ක්‍රියාවට නැංවීම හෝ නව්‍ය පියවර අනුගමනය

## දූෂණ මැඩලීමේ ක්‍රියාවන්ගේ ගණයට අයත් නොවන වෙනත් වටිනා ක්‍රියාකාරකම්

- සමාජ ක්‍රියාකාරකම්
- ආගමික වැඩසටහන්
- ස්වේච්ඡා ක්‍රියාකාරකම්
- නිතිපතා කෙරෙන වෘත්තීයමය ක්‍රියාකාරකම්

## සම්මාන සඳහා ඇගයීමට පාත්‍ර නොවන පුද්ගලයන්, ආයතන/සංවිධාන

- ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ප්‍රතිපත්ති හා අගයයන්ට ප්‍රතිවිරුද්ධව ක්‍රියාකාරකම්වල යෙදෙන පුද්ගලයන් හෝ ආයතන/සංවිධාන
- ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා අධ්‍යක්ෂ මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ විනිසුරු මඩුල්ල

## නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ කෙසේද?

සුපිළිපන් ප්‍රණාම විනිසුරු මණ්ඩලයට නාම යෝජනා ඉදිරිපත් කිරීමේදී තුන් වන පාර්ශවයක් විසින් අදාල පුද්ගලයා හෝ සංවිධානය/ ආයතනය පිළිබඳ නාමයෝජනාව ඉදිරිපත් කළ යුතුය. තොරතුරු සහිත ලිපිගොනුවක් සහ නාමයෝජනාව සම්බන්ධව යෝජනා කෙරෙන පුද්ගලයාගේ හෝ සංවිධානයේ හෝ කැමැත්ත පළකෙරෙන ලිපියක්ද ඇතිව ඉදිරිපත් කළ යුතුය. සම්මාන සඳහා ස්වයංව ඉදිරිපත්වන නාම යෝජනා බාරගනු ලබන්නේ නැත.

## නාම යෝජනා ලිපිගොනුව

නාම යෝජනා ලිපිගොනුවට පහත ලියවිලි අඩංගු විය යුතු අතර ඒවා පහත සඳහන් ආකාරයට පෙළගස්වා සම්පූර්ණ කර තිබිය යුතුය. එම ලිපිගොනු නාම යෝජනා භාරගන්නා අවසන් දිනයේ හෝ ඊට පෙරාතුව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත බාරදිය යුතුය. අසම්පූර්ණ ලිපිගොනු අවධානයට ලක් නොකෙරේ.

i. නාම යෝජනාව ඉදිරිපත් කරනු ලබන පුද්ගලයා විසින් තම අස්සන සහිතව ඉදිරිපත් කරන ලිපිය
ii. අදාල පුද්ගලයාගේ, සංවිධානයේ/ ආයතනයේ ජීව දත්ත පිළිබඳ කෙටි සටහනක්
iii. නාම යෝජනා අයදුම්පත් පුරවා සම්පූර්ණ උපුටා දැක්වීමක් සහිතව යෝජනා කරනු ලබන පුද්ගලයාගේ හෝ සංවිධානයේ හෝ අස්සන සහිතව ඉදිරිපත් කළ යුතුය. (ඇමුණුම 1)
iv. යෝජනා කරනු ලබන පුද්ගලයාගේ හෝ සංවිධානයේ කැමැත්ත පළකෙරෙන ලිපියක්. මියගිය පුද්ගලයෙකුගේ නමක් ඉදිරිපත් කරන විට ඔහුගේ සමීපතම පවුලේ සාමාජිකයෙකුගේ කැමැත්ත පළකෙරෙන ලිපියක් ඉදිරිපත් කළ යුතුය. පවුලේ සමීප සාමාජිකයෙක් නොමැති කළ පවුලේ වෙනත් සාමාජිකයෙකුගේ ලිපියක් ලබාගත හැක. (ඇමුණුම 2)
v. යෝජනා කරනු ලබන පුද්ගලයා විසින් සුපිළිපන් ප්‍රතිඥාව අස්සන් කළ යුතුය. (ඇමුණුම 3)
vi. ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඇතුළු තොරතුරු (ඇමුණුම 4)

## පරිභාහිර තොරතුරු සහ ලියකියවිලි

vii. ජනමාධ්‍ය වාර්තා
viii. අතිරේක පසුබිම් ලියකියවිලි
ix. ගුවන්විදුලි/රූපවාහිනී වැඩසටහන්වල පටිගත කළ තොරතුරු
x. නාම යෝජනාවට සහාය වන අනෙකුත් ලියකියවිලි

නාම යෝජනා අයදුම්පත හෝ වෙනත් දැනගැනීමට අවශ්‍ය පුද්ගලයන්ට එම තොරතුරු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙන් ලබාගත හැක. වැඩි විස්තර අපගේ වෙබ් අඩවිය වන **www.tisrilanka.org** වෙතින්ද ලබාගත හැක.

## සම්මානලාභීන් ප්‍රකාශයට පත්කිරීම

ජාතික සුපිළිපන් ප්‍රණාම විනිසුරු මඩුල්ල ඔක්තෝබර් මාසය අවසන් වන විට සම්මානලාභීන්ගේ නම් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ලබාදීමට නියමිතය.

ප්‍රතිඵල සහ යම් සම්මානයක් පිරිනැමීම අත්හිටුවීම පිළිබඳ තොරතුරු එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී දිනය යෙදෙන දෙසැම්බර් 09 වනදා පැවැත්වෙන. ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙලේදී ප්‍රකාශයට පත් කෙරේ.

## සම්මානය

දූෂණයට එරෙහි ගෝලීය සංවිධානයේ සභාපතිනිය විසින් අස්සන් තැබූ සහතික පත්‍රයක් සහ කුසලානයක් ජාතික නායකයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන සම්මාන උළෙලේදී සම්මානලාභීන්ට ප්‍රදානය කෙරේ.

සම්මානලාභීන්ගේ කුසලතාවයන් හා ඔවුන්ගේ අභීත ක්‍රියාවන් ජනමාධ්‍ය ඔස්සේ ප්‍රකාශයට පත් කෙරේ.

මේ අතර සුදුසුකම් පවතින සම්මානලාභීන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ජාත්‍යන්තර සම්මානය සඳහාද නම් කිරීමට නියමිතය.

## නාමයෝජනා කැඳවීම

ජාතික සුපිළියන් ප්‍රණාම සහ නාමයෝජනා කැඳවීම පිළිබඳ තොරතුරු මුද්‍රිත සහ විද්‍යුතක් මාධ්‍ය ඔස්සේ ප්‍රකාශයට පත් කෙරේ. නාමයෝජනා කැඳවීමේ අවසන් දිනය 2012 අගෝස්තු 31 වනදාය. නාමයෝජනා කැඳවීම **www.tisrilanka.org** වෙබ් අඩවිය මගින්ද ප්‍රසිද්ධ කර ඇත.

## ජාතික සුපිළිපන් සම්මාන විනිසුරු මඩුල්ල

සුපිළිපන්භාවයෙන් පිරිපුන් හා සමාජයේ පිළිගැනීමට ලක් වූ ගෞරවාන්විත පුද්ගලයන් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් විනිසුරු මණ්ඩලය සමන්විතය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් නම් කරනු ලබන එම විනිසුරු මණ්ඩලය නාමයෝජනා ඇගයීම සිදුකරනු ඇත.

නාමයෝජනා ඇගයීමේදී ඔවුන් සුපිළිපන්බවේ ඉහළම අගයයන් අනුගමනය කරනු ලබන අතර නාමයෝජනා ඇගයීමේ ක්‍රියාදාමය පහත පරිදි වේ.

- නාමයෝජනා කැඳවීමට පෙරාතුව සෑම වසරකදීම අදාළ මාර්ගෝපදේශයන් යළි සළකා බැලීම හා ඒවා සංශෝධනයට ලක් කිරීම.
- නාමයෝජනා ඇගයීම සඳහා එලෙස සකස්කරනු ලබන මාර්ගෝපදේශයන් යොදා ගැනීම.
- යම් නාමයෝජනාවකට අදාළව සම්පත්වයක් ඇති වු අවස්ථාවන්හිදී අදාළ විනිසුරුවරයා ඊට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළළකී සිටීම.
- අදාළ නාමයෝජනාවන් සම්බන්ධයෙන් අවශ්‍ය වන අතිරේක තොරතුරු නාමයෝජනාව ඉදිරිපත් කරනු ලබන පුද්ගලයන්ගෙන් හෝ සංවිධානයෙන් හෝ ලබාගැනීම.
- අවශ්‍ය විට වැඩි දුර විමසීම් සිදුකිරීම
- ඉදිරිපත් කර ඇති තොරතුරු ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී එම නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම.
- අවශ්‍ය වු අවස්ථාවකදී යෝජනා කරනු ලබන පුද්ගලයාගේ සේවා ස්ථානයට හෝ සංවිධානයට හෝ ප්‍රදේශයට හෝ ගොස් අවශ්‍ය අතිරේක තොරතුරු හා සාක්ෂි ලබාගැනීමට සහ ඉදිරිපත් කර ඇති තොරතුරු සහතික කරගැනීම
- කෙටි ලැයිස්තුගත කරන ලද නාමයෝජනා ප්‍රකාශයට පත්කිරීම
- සම්මානයට සුදුසුම පුද්ගලයා සහ සංවිධානය/ආයතනය තෝරාගැනීම
- නාමයෝජනා කිසිවක් හෝ පිළිගත නොහැකි මට්ටමක පවත්නා අවස්ථාවේදී සම්මානය පිරිනැමීමෙන් වැළකී සිටීම.
- ප්‍රධාන සම්මානලාභීන්ට අමතරව විශේෂ ඇගයීම සඳහා නම් කිරීම
- ජාතික සුපිළිපන් ප්‍රණාම වැඩසටහනේ සුපිළිපන්භාවය සුරක්ෂිත කිරීමට අවශ්‍ය වු විටකදී සම්මානය නැවත කැඳවීම.

යම් සම්මානයක් නැවත කැඳවීමට අනාගත විනිසුරු මණ්ඩලයක් තීරණය කිරීම හැරෙන්නට විනිසුරු මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

## යම් සම්මානයක් ආපසු කැඳවීම

පහත සඳහන් යම් අවස්ථාවකදී පිරිනැමුණු සම්මානයක් නැවත කැඳවීමට විනිසුරු මණ්ඩලයට හැකියාව ඇත.


- සම්මානය ලබාගැනීම සඳහා අදාළ සම්මානලාභීයා විසින් වැරදි සහගත තොරතුරු ඉදිරිපත් කර ඇති බව අනාවරණය වු අවස්ථාවකදී
- සම්මානලාභියාගේ හැසීරීම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අවමානයක් ඇති කරනු ලබන අවස්ථාවකදී

කෙසේ නමුත් එවන් තීරණයක් ගැනීමට පෙරාතුව විනිසුරු මඩුල්ල අවශ්‍ය තොරතුරු සියල්ල එක් රැස්කරගනු ලබන අතර තීරණයට පෙරාතුව සම්මානලාභීයා කැඳවා කරුණු විමසීමක් ද සිදුකරනු ඇත.

එවන් සම්මානයක් නැවත කැඳවීමේදී ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂකවරයා ඊට අදාළ අයදුම්පතක් විනිසුරු මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර ඉන්පසු විනිසුරු මණ්ඩලය තමන් ගනු ලබන තීරණය පිළිබඳව පිළිගත හැකි හේතුන් දැක්විය යුතුය.

කෙසේ නමුත් සම්මානයක් නැවත කැඳවීම පිළිබඳ ඉල්ලීම පිළිගැනීමට ඒ පිළිබඳව ක්‍රියාත්මකවීමට සහ අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ වගකීම විනිසුරු මණ්ඩලය සතුය.

## තෝරාගැනීමේ ක්‍රියාවලිය



## නාමයෝජනා ඉදිරිපත් කිරීම

සම්පූර්ණ කරන ලද නාමයෝජනා ලැයිස්තුව 2012 අගෝස්තු 31 වනදා හෝ ඊට පෙරාතුව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත තැපෑලෙන් හෝ ඊමේල් හරහා ඉදිරිපත් කළ යුතුය.

සම්බන්ධීකාරක
ජාතික සුපිළිපන් ප්‍රණාම
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා
නො. 6 37 වන පටුමග
රැජිණ පාර
කොළඹ 03.

දුරකථනය ៖ 0114 369781/0114 369782/0114 369783

ඊමේල් ៖ nia@tisrilanka.org

නාමයෝජනා භාරගන්නා අවසන් දිනය 2012 අගෝස්තු 31 වනදා

## ඇමුණුම 1

## නාමයෝජනා අයදුම්පත

මෙම නාමයෝජනා පත්‍රය නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන පුද්ගලයා හෝ සංවිධානය හෝ විසින් පුරවා අනෙකුත් ලියකියවිලි සමග ඉදිරිපත් කළ යුතුය.

| | |
|---|---|
| යෝජනා කරනු ලබන<br>නම හෝ සංවිධානය<br>සම්පූර්ණයෙන් | |
| ආගමික නායක<br><br>පුරුෂ/කාන්තා | |
| සංවිධානයක් නම්<br><br>එහි ආයතන<br><br>ප්‍රධානියාගේ නම | |
| නාමයෝජනාව ඉදිරිපත් කරන පුද්ගලයන් | |
| නම | |
| ලිපිනය | |
| දුරකථන අංකය | |
| ඊමේල් | |
| නම | |
| ලිපිනය | |
| දුරකථන අංකය | |
| ඊමේල් | |
| උපුටනය<br>(වචන 500 කින් සමන්විත විය යුතුය.)<br>යෝජනා කරනු ලබන<br>පුද්ගලයා හෝ සංවිධානය<br>සම්මාන ලැබීමට<br>පවතින සුදුසුකම්<br>සඳහන් කරන්න | |

| මෙයට පෙරාතුව නාමයෝජනා ඉදිරිපත් කර තිබෙනවාද සහ වෙනත් ජාතික සම්මාන ලබා තිබෙනවාද සඳහන් කරන්න | | |
|---|---|---|
| සම්මානයේ නම | | |
| වසර | | |
| සම්මානය ප්‍රදානය කළ ආයතනය | | |

| හෙළිදරව් කිරීම | |
|---|---|
| යෝජනා කරනු ලබන පුද්ගලයා හෝ සංවිධානය හෝ වෙනත් යම් අපරාධයක්<br><br>හෝ වෙනත් වරදකට දඬුවම්<br><br>ලබා තිබෙනවාද | නාමයෝජනාව ඉදිරිපත් කරන තැනැත්තා<br><br>නම ඃ<br><br>අත්සන ඃ<br><br>දිනය |
| යම් අපරාධයක්<br><br>පිළිබඳව හෝ විනය කඩකිරීමක් පිළිබඳ හෝ දැනට විභාග වෙමින් පවත්නා<br><br>ක්‍රියාදාමයක් පවතීද | |

# ඇමුණුම 2

## කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය

වෙත ඃ ජාතික සුපිළිපන් ප්‍රණාම සම්බන්ධීකාරක
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය
නො. 6, 37 වන පටුමග, රැජින පාර
කොළඹ 3.

නාමයෝජනාව ඉදිරිපත් කරන්නාගේ නම
ලිපිනය

දිනය ඃ

මාතෘකාව ඃ කැමැත්ත පළකිරීමේ ලිපිය

1.ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වසර 2012 දී පවත්වන ජාතික සුපිළියන් ප්‍රණාම සඳහා ඉදිරිපත් කරනු ලබන නාමයෝජනාවට කැමැත්ත පළකරනු ලබන බව සහතික කිරීම සඳහා

2. එම නාමයෝජනාවට මාගේ කැමැත්ත පළකරමි.

3. යම් ලෙසකින් මාගේ නම කෙටි ලැයිස්තු ගත වුවහොත් එම නම ප්‍රසිද්ධියට පත්කිරීමට කැමැත්ත පළකරමි.

4. මාගේ නාමයෝජනාවට සහ කුසලතාව පිළිබඳව පුද්ගලික විමර්ෂණයක යෙදීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අවසර ලබා දෙමි.

5. නාමයෝජනා ඉදිරිපත් කළ පසු ඒ සියලු ලිපිගොනු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ දේපළ බවට පත්වන බව පිළිගනිමි. කිසිඳු ගාස්තුවකින් තොරව නාමයෝජනා ඉදිරිපත් වූවන් පිළිබඳව තොරතුරු ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙලට අදාළව දේශීය හෝ විදේශීය වශයෙන් මාධ්‍ය ඔස්සේ ප්‍රචාරයට පත්කිරීමට කැමැත්ත පළකරමි.

6. නාමයෝජනා ඉදිරිපත් වූවෙකු ලෙස මා/අප පුද්ගලික තොරතුරු මාගේ/අපගේ අවබෝධයකින් හා ලිඛිත අවසරයකින් තොරව එකතු කිරීම හා එක් රැස් කිරීම වළක්වාලමි/වලක්වැලමු විනිසුරු මඩුල්ලේ ඇගයීම සඳහා පමණක් මාගේ/අපගේ පුද්ගලික තොරතුරු යොදා ගැනීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත අවසර දෙමි/දෙමු

7. නාමයෝජනා මාර්ගෝපදේශයන් අනුව සුපිළිපන් ප්‍රතිඥාව පිළිගනු ලබන අතර සෑම අවස්ථාවකදීම සුපිළිපන් බව ඉතා ඉහළින් පිළිපැදීමට ප්‍රතිඥා දෙමි.

විශ්වාසී

අත්සන

නම ඃ

දිනය ඃ

## ඇමුණුම 3

## සුපිළිපන් ප්‍රතිඥාව

Transparency International Sri Lanka
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
ட்ரான்ஸ்பேரன்ஸி இன்டர்நஷனல் ஸ்ரீலங்கா

Integrity Pledge
I,
………………......………..,
with great determination
pledge to live and serve
as an honourable and incorruptible
Sri Lankan
with a deep sense
of accountability, responsibility and
transparency
in my personal, professional and
occupational life
with the noble purpose of passing on
to future generations
a nation ennobled by Integrity,
dedicating myself as a pioneer in
upholding democratic values,
human rights and duties
unsullied by forces that
impede human and national progress

**සුපිළිපන්න ප්‍රතිඥාව**

සුපිළිපන් දේශයක්
මතු පරපුරට දායාද කිරීමේ
උතුම් පරමාර්ථයෙන්
ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ද
මිනිස් අයිතිවාසිකම් හා යුතුකම් ද
සුරැකීම වෙනුවෙන්
පුරෝගාමීව කැපවෙමින්
මනුෂ්‍යත්වයට හා රටේ ප්‍රගමනයට
අහිතකර කවර බලවේගයක් අභිමුව වුව
අකම්පිතව
පෞද්ගලික හා වෘත්තීය ජීවිතයේදී
මනා විනිවිද භාවයකින් ද
වගවීමට හා වගකීමට කැප වූ
දෘෂ්ටියකින් ද යුත්
දූසැරියෙන් තොර හරසැරි
ශ්‍රී ලාංකේය පුරවැසියෙකු සේ
අභිමානවත් ලෙස
ජීවත්වන බවට හා සේවය කරන බවට
........................................................... වන මම
දැඩි අධිෂ්ඨානයකින් යුක්තව
ප්‍රතිඥා දෙමි.

நேர்மைத்திறன் சத்தியப் பிரமாணம்
நான்
...........................................................
நேர்மைத்திறன் மிகு தேசமொன்றை
நாளைய சந்ததிக்கு உரித்தாக்கும் உயரிய
நோக்குடன் ஜனநாயக ரீதியான
பெறுமானங்களையும் உரிமைகளையும்
கடப்பாடுகளையும் பாதுகாப்பதற்கு
முன்னோடியாக
விளங்கி அர்ப்பணித்துச் செயலாற்றி
மானுடத்திற்கும்
நாட்டின் முன்னேற்றத்திற்கும் எதிரான
எந்தவொரு ஆதிக்க சக்திக்கு
அடிபணியாமல்
தனிப்பட்ட வாழ்விலும் தொழில் வாழ்விலும்
சிறந்த வெளிப்படைத் தன்மையுடனும்
பொறுப்புணர்வுடனும்
அர்ப்பணிப்புக் கண்ணோட்டத்துடனும்
ஊழலற்ற சிறந்த இலங்கையராக
வாழ்வேன் எனவும் சேவையாற்றுவேன்
எனவும்
திடசங்கற்பம் பூண்டு
உறுதிமொழி பகர்கின்றேன்.

නම :

අත්සන :

දිනය :

## ඇමුණුම 4

## නම්/ලිපිනයන් ඇතුළු තොරතුරු ඃ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ

| | |
|---|---|
| ට්‍රාන්ස්පේරනසි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා | |
| ජාතික සුපිළිපන් ප්‍රණාම | |
| ඥාතීන් නොවන | |
| නම ඃ | නම ඃ |
| ලිපිනය ඃ | ලිපිනය ඃ |
| දුරකථන අංක ඃ | දුරකථන අංක ඃ |
| ඊමේල් ඃ | ඊමේල් ඃ |
| අත්සන සහ දිනය | අත්සන සහ දිනය |

## ඇමුණුම 5

# විනිසුරු මඬුල්ල විසින් සම්මත කරගන්නා ලද සම්මානලාභීන් තෝරාගැනීමේ නිර්ණායකයන්

උත්සාහය

- ඒක පුද්ගල
- සංවිධානයක්/ආයතනයක් ලෙස

මැදිහත්වීම

- පවත්නා මෙවලම් සහ ක්‍රමවේදයන් උපයෝගී කරගැනීම
- දූෂණය මැඩලීමේ යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම
- නව ක්‍රියාදාමයන්

1. පොදු නිර්ණායකයන්

    1.1 සිදුකරන ලද දූෂණ විරෝධී ක්‍රියාවේ බලපෑම සැළකිය යුතු මට්ටමක පැවතීම.

    1.2 උත්සාහයෙන් ඇතිකරන ලද බලපෑම කෙතරම්ද යන්න, එමගින් ඇතිවූ බලපෑම සංවිධාන, ප්‍රාදේශීය ජන කොට්ඨාශයන් , දේශය හා අන්තර් ජාතික මට්ටම දක්වා පැතිර යාම.

    1.3 අනාගතයේදී දූෂණය ඇතිවීම වළක්වාලීමේ චර්යා ධර්මයන් එමඟින් බිහිකිරීමට හැකිවීම.

    1.4 යම් පුද්ගලයෙකු තමන් දරණ තනතුර හරහා චිල්ල විය හැකි ශක්තිමත් හා දුෂ්කර අභියෝගයන් පරයමින් දූෂණ විරෝධී සටනේ යෙදීම.

    1.5 සුබවාදී සවිමත් බලපෑමක් ඇතිකරලීමට ආර්ථික, පුද්ගලික, ශාරීරික, සමාජයීය හා වෘත්තීමය වශයෙන් සිදු කළ කැපකිරීම්.

    1.6 එම උත්සාහය දූෂණ විරෝධී සටනේ මිණුම්දණ්ඩක් ලෙස යොදාගැනීමට ඇති හැකියාව.

    1.7 ඔහු හෝ ඇය විසින් දරණ තනතුර හෝ වෘත්තීය දූෂණ විරෝධී ක්‍රියාවන්හි යෙදීමට වාසිසහගත ලෙස බලපෑම සඳහා පැවති අවකාශයන්.